කරුණු පත්‍රිකාව

# මගේ සෞඛ්‍ය යෙදුම

## my health (මගේ සෞඛ්‍ය) යෙදුම යනු කුමක්ද?

**My Health** යෙදුම ඔබගේ ජංගම දුරකථනය හෝ උපාංගය භාවිතයෙන් My Health Record තොරතුරු වෙත ප්‍රවේශ වීමට, බාගත කිරීමට, ගබඩා කිරීමට සහ බෙදා ගැනීමට ඔබට ඉඩ සලසයි. **my health** (මගේ සෞඛ්‍ය) යෙදුම භාවිත කිරීමට ඔබට අන්තර්ජාල සම්බන්ධතාවයක් අවශ්‍ය වේ.

## my health (මගේ සෞඛ්‍ය) යෙදුමේ ප්‍රතිලාභ මොනවාද?

- ඔබට ආරක්ෂිතව ප්‍රවේශ වීමට සහ මගේ සෞඛ්‍ය වාර්තාව බැලීමට **my health** (මගේ සෞඛ්‍ය) යෙදුම භාවිත කළ හැක.
- **my health** (මගේ සෞඛ්‍ය) මුල් තිරයේ ඇති ටයිල් ඔබට ඉක්මණින් සහ පහසුවෙන් තොරතුරු සොයා ගැනීමට ඉඩ සලසයි.
- **my health** වෛද්‍ය ඉතිහාස කාලරාමුව ඔබට ඔබේ වෛද්‍ය ඉතිහාසය වෙත ඉක්මන් සහ පහසු ප්‍රවේශයක් ලබා දෙයි.
- ඔබට වසර සහ කාණ්ඩය අනුව තොරතුරු පෙරීමට හැකිය.
- **my health** (මගේ සෞඛ්‍ය) යෙදුම ඔබට අන්තර්ජාලයට ප්‍රවේශය ඇති ගෝලීය වශයෙන් ක්‍රියා කරයි.

## මගේ සෞඛ්‍ය වාර්තාවේ සියලුම විශේෂාංග යෙදුමේ තිබේද?

සමහර විශේෂාංග සමාන වේ. ඔබට My Health Record (myGov හරහා) සහ **my health** (මගේ සෞඛ්‍ය) යන දෙකෙහිම ප්‍රධාන සෞඛ්‍ය තොරතුරු නැරඹිය හැක. මෙයට ඔබ එකතු කර ඇති සායනික ලේඛන, Medicare ලේඛන සහ වැදගත් තොරතුරු ඇතුළත් වේ. ඔබ යමෙකු සඳහා නම් කරන ලද හෝ බලයලත් නියෝජිතයෙකු නම්, ඔබට ඔවුන්ගේ වාර්තාව ද බැලිය හැක.

කෙසේ වෙතත්, දැනට ඔබට **my health** (මගේ සෞඛ්‍ය) භාවිතයෙන් තොරතුරු එක් කිරීමට හෝ සමහර වාර්තා සැකසීම් කළමනාකරණය කිරීමට නොහැක. ඔබ තොරතුරු එක් කිරීමට හෝ ඔබේ වාර්තා සැකසීම් කළමනාකරණය කිරීමට myGov හරහා My Health Record භාවිත කළ යුතුය.

## යෙදුමේ ඇති ආරක්ෂක විශේෂාංග මොනවාද?

**my health** (මගේ සෞඛ්‍ය) ආපදා රහිතයි සහ ආරක්ෂිතයි. ඔබට ඔබගේ උපාංගයේ ආරක්ෂාවට අමතරව ආරක්ෂිත ඉලක්කම් 6ක PIN එකක් පිහිටුවිය හැක. ඔබ උපාංගය අන් අය සමඟ බෙදා ගැනීමට පෙර යෙදුමෙන් ඉවත් වීමට මතක තබා ගන්න. මෙය ඔබගේ තොරතුරුවල පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීමට උපකාරී වේ.

ඔබට **my health** (මගේ සෞඛ්‍ය) යෙදුමේ ආරක්ෂාව පිළිබඳ වෙනත් ගැටළු තිබේ නම්, ඔබ වහාම ඔබගේ PIN අංකය වෙනස් කළ යුතුය. ඔබට යෙදුමේ ගිණුම් පිටුවේදී ඔබගේ PIN අංකය වෙනස් කළ හැක. ඔබ එය විනාඩි 5ක් භාවිතා නොකළේ නම් **my health** ස්වයංක්‍රීයව ඔබව යෙදුමෙන් ඉවත් කරනු ඇත.

## **my health** (මගේ සෞඛ්‍ය) යෙදුමෙන් මට බාගත කර බෙදා ගත හැක්කේ කුමක්ද?

**my health** app මඟින් My Health Record වෙතින් ලේඛන ඔබේ ජංගම දුරකථනයට බාගත කිරීමට ඔබට ඉඩ සලසයි. ඔබට එන්නත් ලේඛනවල සාක්ෂි සහ රුධිර පරීක්ෂණ ප්‍රතිඵල වැනි සායනික ලේඛන වැනි අයිතම බාගත කළ හැකිය. ඔබට මේවා ඔබගේ දුරකථනයේ ගබඩා කළ හැක. **my health** (මගේ සෞඛ්‍ය) ඔබට වෙනත් පුද්ගලයින් හෝ සංවිධාන සමඟ ලේඛන බෙදා ගැනීමට ඉඩ සලසයි. ඔබ බෙදා ගැනීමට යෙදුම භාවිතා කරන සෑම අවස්ථාවකම, ඔබට උත්පතන දැනුම්දීමක් ලැබෙනු ඇත. ඔබේ තොරතුරු හුවමාරු කර ගැනීමේදී ප්‍රවේශම් විය යුතු බව එය ඔබට මතක් කර දෙනු ඇත.

## මට **my health** (මගේ සෞඛ්‍ය) යෙදුම ලබා ගත හැක්කේ කොතැනින්ද?

ඔබට Google Play (Android උපාංග සඳහා) හෝ App Store (Apple උපාංග සඳහා) 'my health gov' සෙවීමෙන් යෙදුම බාගත කළ හැක. යෙදුම බාගත කිරීමට QR කේතය පරිලෝකනය කරන්න.

## අමතර සම්පත් සහ සහාය

**my health** වෙබ් අඩවිය: www.digitalhealth.gov.au/myhealth

my Health යෙදුම මාර්ගගත ඉගෙනීම:
https://training.digitalhealth.gov.au/mod/page/view.php?id=1035

My Health (මගේ සෞඛ්‍ය) වාර්තා උපකාරක මාර්ගය
1800 723 471 (option 1), සතියේ දින 7ම දවසේ පැය 24 පුරාම ලබා ගත හැක.

ඕස්ට්‍රේලියානු ඩිජිටල් සෞඛ්‍ය ඒජන්සි සම්බන්ධතා පෝරමය:www.digitalhealth.gov.au/contact-us

භාෂා සහ භාෂණ පරිවර්තන සේවාව131 450
www.tisnational.gov.au/Help-using-TIS-National-services/Contact-TIS-National

ජාතික රිලේ සේවාව

1300 555 727
www.accesshub.gov.au